④

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2026/27 – 2017 ජූලි මස 05 වැනි බදාදා – 2017.07.05

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 6/2001 .

### 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 89ආ සහ 89ඇ(1) වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදන ලද රීති.

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2017 ජූලි මස 05 වැනි දින,
කොළඹ දී ය.

### රීති

1. මේ රීති 2017 අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රීති යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. (1) කිසියම් තනි පුද්ගලයකු :-

(අ) අවුරුදු දහ අටට වැඩි නම්;

(ආ) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වන්නේ නම්;

(ඇ) පහත සඳහන් සුදුසුකම්, එනම්–

(i) එක්සත් රාජධානියේ අලාභ ගැලපුම්කරුවන්ගේ වරලත් ආයතනයේ ආශ්‍රිත සාමාජික සුදුසුකමක්;

(ii) ඕස්ට්‍රේලියාවේ අලාභ ගැලපුම්කරුවන්ගේ වරලත් ආයතනයේ ආශ්‍රිත සාමාජික සුදුසුකමක්;

(iii) එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජික සුදුසුකමක්;

(iv) ඉන්දියාවේ රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජික සුදුසුකමක්;

(v) මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් අදාළ සුදුසුකම්; හෝ

(vi) රක්ෂණ හිමිකම් යටතේ අලාභ විමර්ශනය කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳ අවම වශයෙන් වසර දහයක යෝග්‍ය පළපුරුද්දක්;



මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඇත්තේ නම්,

(ඈ) යෝග්‍ය සහ සුදුසු වන්නේ නම්;

(ඉ) රක්ෂණ හිමිකම් යටතේ අලාභ විමර්ශනය කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳ වසර දෙකක යෝග්‍ය පළපුරුද්දක් ඇත්තේ නම්;

(ඊ) අවම වශයෙන් මිලියන පහක සීමාවකින් යුත් රක්ෂණ ගිවිසුමක ආවරණයක් ඇති ප්‍රමාණවත් වෘත්තීය වගකීම් සහිත රක්ෂණයක් ඇත්නම්, සහ

(උ) රක්ෂණකරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ හෝ තැරැව්කරුවකුගේ අධ්‍යක්ෂවරයකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු, නිලධරයකු, කොටස්හිමියකු හෝ සේවා නියුක්තිකයකු නොවන්නේ නම්,

මිස, අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කරනු ලැබීම හෝ එවැන්නකු ලෙස අඛණ්ඩව කටයුතු කිරීම හෝ පෙනී සිටීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා යම් පුද්ගලයකු ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා මෙහි සඳහන් පළමුවන උපලේඛනයේ සඳහන් අකෘති පත්‍රය අනුව සකසාගත් ඉල්ලුම් පතකින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

3.(1) අලාභ ගැලපුම්කරුවකු ලෙස ක්‍රියා කිරීම සඳහා වන කිසිදු සමාගමක් –

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථාපරිදි ලියාපදිංචි කර ඇති සමාගමක් වන්නේ නම්;

(ආ) එහි මූලික සේවක පිරිස කුසලතා සහ පළපුරුදු අනුව යෝග්‍ය සහ සුදුසු වන්නේ නම්;

(ඇ) අවම වශයෙන් මිලියන දහයක සීමාවකින් යුත් රක්ෂණ ගිවිසුමක ආවරණයක් ඇති වෘත්තීය වගකීම් සහිත රක්ෂණයක් ඇත්නම්;

(ඈ) එහි සේවා නියුක්තියේ හෝ සමාගමක නිර්දේශ යටතේ සේවයේ යෙදී සිටින අධ්‍යක්ෂ මණ්ඩල හා සේවය කරන පුද්ගලයන් බහුතරයක් 2(අ), (ආ), (ඇ), (ඈ) සහ (උ) රීතිවල නියමයන් සපුරාලනු ලැබ ඇත්නම්;

(ඉ) රක්ෂණකරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ හෝ තැරැව්කරුවකු පාලක හෝ ආශ්‍රිත සමාගමක් නොවන්නේ නම්; සහ

(ඊ) සමාගමක කොටස්කරුවකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු, නිලධරයකු හෝ අධ්‍යක්ෂවරයකු, රක්ෂණකරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ හෝ තැරැව්කරුවකුගේ අධ්‍යක්ෂවරයකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු, නිලධරයකු, කොටස්කරුවකු හෝ සේවා නියුක්තිකයකු නොවන ලෙස නිශ්චිතව දක්වා ඇත්නම්,

මිස, අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කරනු ලැබීම හෝ එවැන්නකු ලෙස අඛණ්ඩව ක්‍රියා කිරීම හෝ පෙනී සිටීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා යම්කිසි සමාගමක් ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා මෙහි සඳහන් දෙවන උපලේඛනයේ සඳහන් අකෘති පත්‍රය අනුව සකසාගත් ඉල්ලුම් පතකින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

4. ලියාපදිංචි ගාස්තු පහත දැක්වෙන පරිදි මණ්ඩලයට ගෙවිය යුතු ය :

| *ඉල්ලුම්කරු අයත් කාණ්ඩය* | *මුදල (ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|
| | *පළමු ලිත් වර්ෂය* |
| තනි පුද්ගලයකු සඳහා | 25,000.00 |
| සමාගමක් සඳහා | 75,000.00 |

5. පළමුවන ලිත් වර්ෂයෙන් පසුව, ලියාපදිංචි ගාස්තු එක් එක් වර්ෂයේ ජනවාරි මස අවසන් වීමට පෙරාතුව පහත දැක්වෙන පරිදි මණ්ඩලයට ගෙවිය යුතු ය :

| *ඉල්ලුම්කරු අයත් කාණ්ඩය* | *මුදල (ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|
| තනි පුද්ගලයකු සඳහා | 15,000.00 |
| සමාගමක් සඳහා | 50,000.00 |

6. අලාභ ගැලපුම්කරුවන් ලෙස ක්‍රියාකරන හෝ පෙනී සිටින සියලු තැනැත්තන්, මෙම රීති ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට මාස හයක් ඇතුළත ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතු ය.

7. මේ රීතිවල -

''පනත'' යන්නෙන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත අදහස් වේ ;

''මණ්ඩලය'' යන්නෙන්, පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය අදහස් වේ ; සහ

''සමාගම'' යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලබන යම් සමාගමක් අදහස් වේ.

''රක්ෂණකරු'', ''රක්ෂණ නියෝජිත'' සහ ''තැරැව්කරු'' යන්නට පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය.

''අලාභ ගැලපුම්කරු'' යන්නෙන්, රක්ෂණ හිමිකම් පෑමක දී උද්ගත වන අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ විශේෂිත දැනුමක් ඇති සහ මේ පනතේ විධිවිධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ ;

**පළමුවන උපලේඛනය**

**අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය**

**(තනි පුද්ගලයන් සඳහා)**

(2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රය)

| යොමු අංක | |
|---|---|
| ලියාපදිංචි ගාස්තු -<br>පළමු වසර<br>වාර්ෂික ගෙවීම | <br>රු.<br>රු. |

අධ්‍යක්ෂ ජනරාල්වරයා,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය,
11 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01, වෙත.

පහත අත්සන් කරනු ලබන ........................................................................ (ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (නේවාසිකයකු, පුරවැසියකු) වෙමින්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 89 ඇ (1) වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරන අතර, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් ඇගැයීම සඳහා අදාළ උපකාරක ලේඛන ද සමග පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

1. ඉල්ලුම්කරුගේ නම :

2. ලියාපදිංචි ලිපිනය :

 (i) ලිපිනය :
 (ii) දුරකථනය :
 (iii) ෆැක්ස් :
 (iv) ඊ මේල් :

3. ව්‍යාපාරික ලිපිනය :

 (i) ලිපිනය :
 (ii) දුරකථනය :
 (iii) ෆැක්ස් :
 (iv) ඊ මේල් :

4. උපන් දිනය :
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)

5. ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය :

6. අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්, සාමාජිකත්ව සහ පළපුරුදු :
(සහතිකවල පිටපත් අමුණන්න)

7. අවම වශයෙන් රුපියල් මිලියන පහක සීමාවකින් යුත් වෘත්තීය වගකීම් රක්ෂණයක් ඔබ විසින් භාර දී තිබේ ද?
එසේ නොමැතිනම් මේ ආකෘතිය සමග වෙනත් ඇමුණුමක් මගින් පැහැදිලි කිරීමක් සපයන්න.
(ලියාපදිංචි කළ දින සිට බලපැවැත්විය යුතු වෘත්තීය වගකීම් රක්ෂණ ගිවිසුම්වල පිටපත් අමුණන්න.)

8. මේ ඉල්ලුම්පත්‍රය භාර දීමට පෙරාතුව වසර තුනක කාලසීමාවක් තුළ දී යම් අවස්ථාවක ඔබ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස හෝ සේවා නියුක්තිකයකු ලෙස සේවය කර තිබේ ද?

* 9. යම් අපරාධයක් සඳහා ඔබ ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ තිබේ ද?

* 10. ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ ඔබ බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට හෝ පත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබ තිබේ ද?

* 11. ණය ආපසු ගෙවීමට හෝ සිවිල් අලාභයක් පියවීමට අදාළව ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක නිසි බලය ඇති අධිකරණයක් විසින් දෙන ලද යම් නඩු තීන්දුවක් හෝ නියමයක් සම්පූර්ණ කිරීමට ඔබ අපොහොසත් වී ඇති ද?

* 12. ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නිසි බලය ඇති අධිකරණයක් මගින් ඔබ සිහිවිකල තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබ තිබේ ද?

* 13. ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් රක්ෂණ සමාගමක, තැරැව්කරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ වෙනත් යම් අධිකාරිමය තනතුරක ඔබ සේවය කිරීම නියාමන හෝ වෙනත් අධිකාරයක් මගින් හෝ නිසි බලය ඇති අධිකරණයක් මගින් වළක්වනු ලැබ, ඉවත්කරනු ලැබ හෝ අත්හිටවනු ලැබ තිබේ ද?

* 14. (i) ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ප්‍රදානය කරන ලද බලපත්‍රයක් හෝ වෙනත් අධිකාරයක් අත්හිටවනු ලැබ හෝ අවලංගු කර ඇති ; හෝ

(ii) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැරව ගණන් බේරා වසා දමා ඇති හෝ ගණන් බේරා වසා දැමීමට පත්ව ඇති හෝ අනිවාර්ය ඈවර කිරීමක් සිදුකර ඇති හෝ අද්මිනිස්ත්‍රාසිකරණය සඳහා යොමු කර ඇති,

යම් රක්ෂණ සමාගමක, බැංකුවක, තැරැව්කරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, ප්‍රධාන නිලධරයකු, මූලික නිලධරයකු හෝ වෙනත් යම් අධිකාරි තනතුරක් දරනු ලබන නිශ්චිතව සඳහන් කරන ලද නිලධරයකු ලෙස සිට ඇත් ද?

15. රක්ෂණ හිමිකම් සහ ආශ්‍රිත කාරණා යටතේ අලාභ විමර්ශනය කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳ පළපුරුද්ද.

| සමාගමේ නම | දරන ලද තනතුර | කරන ලද කාර්යයන් පිළිබඳ ලුහුඬු විස්තරය | කාල සීමාව |
|---|---|---|---|
| | | | |

(සහතික වල පිටපත් සහ වෙනත් සාක්ෂි ඇත්නම් අමුණන්න.)

16. ඔබ රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකුගේ හෝ තැරැව්කරුවකුගේ අධ්‍යක්ෂවරයකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු, නිලධරයකු, කොටස් හිමියකු හෝ සේවා නියුක්තිකයකු වේද?

* පිළිතුර ''ඔව්'' නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ කෙසේ වුවත්, අයදුම්කරු යෝග්‍ය සහ සුදුසු බවට කරුණු පහදන්න. (අවශ්‍ය නම් වෙනම පත්‍රිකාවක් යොදා ගන්න.)

17. මේ අකෘතියට අමුණා ඇති වෙනම කඩදාසියක ඔබ සුදුසු ද නැද්ද යන්න තක්සේරු කිරීම පිණිස ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සාධාරණව දැනුවත් විය යුතු වෙනත් යම් තොරතුරු සපයන්න.

18. සහතික කිරීම :

මා විසින් ඉහත සඳහන් කරන ලද තොරතුරු සහ අමුණා ඇති ලේඛන මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සම්පූර්ණ, සත්‍ය ඒවා බව සහ නොමගයවනසුළු ඒවා නොවන බවට මෙයින් ප්‍රකාශ කර සහතික කර සිටිමි.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :

ආකෘතිපත්‍රය පිරවීම සඳහා උපදෙස් :

(1) මේ ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙරාතුව රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන සහ 2017 ජූලි 05 වන දින 2026/27 අංක දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රීති ඉතා සැලකිල්ලෙන් තේරුම් ගැනීම සහ අධ්‍යයනය කිරීම වැදගත් වේ.

(2) අවශ්‍ය සියලු උපකාරක ලේඛන සමග නිසිලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ඉල්ලුම්කරු විසින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත භාරදිය යුතු ය. ඉල්ලුම්පත්‍රයේ නියමකර ඇති සියලු තොරතුරු සහ ලේඛන සැපයිය යුතු අතර සඳහන් කළ යුතු අයිතමයක් නොමැති අවස්ථාවක දී කරුණාකර ''අදාල නොවේ'' යන්න සඳහන් කරන්න. වෙන් වශයෙන් තොරතුරු පත්‍රිකා අමුණා ඇති අවස්ථාවක දී අකෘති පත්‍රය මත සටහන් කරන්න.

(3) ''ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ'' නමින් ආදායකයාගේ ගිණුමට පමණයි යන චෙක්පතක් හෝ බැංකු අණකරයක් මගින් (අදාළ බදු සමඟ) රු. 25,000 ක ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවිය යුතුය.

(4) ඉල්ලුම්පත්‍රයට අමුණා ඇති ලේඛනවල පිටපත් මුල් පිටපත් වල සත්‍ය පිටපත් බවට දිවුරුම් කොමසාරිස්වරයකු හෝ සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(5) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය එහි සියලු කරුණු සම්පූර්ණ කර ඇත්නම් පමණක් ලියාපදිංචි කිරීම සඳහා සලකා බලනු ලැබේ.

(6) මේ ඉල්ලුම්පත්‍රය යටතේ නියමකරන ලද තොරතුරු සහ ලේඛන හෝ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියම කරන ලද යම් තොරතුරු හෝ ලේඛන භාරදීමට අපොහොසත් වීම නිසා ඉල්ලුම්පත්‍රය පිළිබඳ කටයුතු කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය හැකි ය.

(7) ඉල්ලුම්කරු විසින් ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කිරීමට පෙරාතුව ඉල්ලා අස්කරගනු ලබන්නේ නම් ඉල්ලුම්කරු විසින් ගෙවන ලද ගාස්තු වලින් (බදු නොමැතිව) සියයට පනහක මුදල් ප්‍රමාණයක් පමණක් ආපසු ගෙවනු ලැබේ.

(8) අසත්‍ය හෝ නොමගයවනසුළු තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ වරදක් වේ.

## දෙවන උපලේඛනය

අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය
(සමාගමක් සඳහා)

(2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ සකසන ලද ඉල්ලුම්පත්‍රය)

| | |
|---|---|
| යොමු අංක | |
| ලියාපදිංචි ගාස්තු –<br>පළමු වසර<br>වාර්ෂික ගෙවීම | <br>රු.<br>රු. |

අධ්‍යක්ෂ ජනරාල්වරයා,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය,
11 වන මහල, නැගෙනහිර කුලුන,
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
කොළඹ 01, වෙත,

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 89ඇ(1) වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා (ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් බලයලත් නිලධරයකු වශයෙන්) පහත අත්සන් කරනු ලබන .................................................. විසින් ඉල්ලුම්කාර සමාගම වෙනුවෙන් ඉල්ලුම් කරන අතර, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ඇගයීම සඳහා අදාල උපකාරක ලේඛන සමඟ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

1. ඉල්ලුම්කාර සමාගමේ නම :

2. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඉල්ලුම්කාර සමාගම ලියාපදිංචි කර තිබේ ද?
(සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකය සහ සාංගමික ව්‍යවස්ථාවේ පිටපතක් අමුණන්න.)

3. ලියාපදිංචි ලිපිනය :
(i) දුරකථනය :
(ii) ෆැක්ස් :
(iii) ඊ මේල් :

4. ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ ලිපිනය (ලියාපදිංචි කළ ලිපිනය වෙනස්ව ඇත්නම්) :
(i) දුරකතනය :
(ii) ෆැක්ස් :
(iii) ඊ මේල් :

5. සියලු අධ්‍යක්ෂවරුන්ගේ නම් :
(සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද ඉල්ලුම්කාර සමාගමේ මෑතක දී නිකුත් කළ 20 වන ආකෘතියේ පිටපතක් සහ එක් එක් අධ්‍යක්ෂවරයා විසින් 3 වන රීතියේ අවශ්‍යතා සපුරා ඇති බවට සහතික කරනු ලබන දිවුරුම් ප්‍රකාශ අමුණන්න.)

6. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහ නිලධරයන්ගේ නම් සහ තනතුරු :

7. කොටස්කරුවන්ගේ නම් සහ දැනට දරන කොටස් ප්‍රමාණය :
(සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද ඉල්ලුම්කාර සමාගමේ ඉතා මෑතක දී ලබාගත් 6 වන ආකෘතියේ පිටපතක් අමුණන්න.)

8. ගෙවා නිමි කොටස් (ප්‍රකාශිත) ප්‍රාග්ධනය :

9. ඉල්ලුම්කාර සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ, නිලධරයන්ගේ සහ එහි මූලික සේවක මණ්ඩලයේ අධ්‍යාපන සුදුසුකම් සහ වෙනත් වෘත්තීය සුදුසුකම් සහ පළපුරුදු :

10. ඉල්ලුම්කාර සමාගම විසින් සේවයේ යොදවා ඇති හෝ ඉල්ලුම්කාර සමාගමේ විධානය යටතේ වැඩ කරන අතරතුර දී රක්ෂණ හිමිකම් යටතේ අලාභ පිළිබඳ විමර්ශනය කරන සහ තක්සේරු කරන අධ්‍යක්ෂවරුන්ගේ සහ සියලු තනි පුද්ගලයන්ගේ නම් :
(මෙම තනි පුද්ගලයන් 2(අ) සිට (ඈ) දක්වා සහ (උ) රීතිවල අවශ්‍යතාවන් සපුරාලිය යුතු ය.– පහත (4) වන සටහන බලන්න.)

11. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් මූලික පුද්ගලයකු ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හෝ සේවා නියුක්තියකු ලෙස මේ ඉල්ලුම්පත්‍රය භාරදීමට පෙරාතුව වසර තුනක කාල සීමාවක් තුළ දී සේවය කර තිබේ ද?

*12. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් මූලික පුද්ගලයකු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නිසි බලය ඇති අධිකරණයක් විසින් යම් අපරාධයක් සඳහා වරදකරුවකු කරනු ලැබ තිබේ ද?

*13. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් මූලික පුද්ගලයකු නැතහොත් එම ඉල්ලුම්කාර සමාගම ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට පැමිණ ඇතැයි ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ ද?

*14. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් මූලික පුද්ගලයකු නැතහොත් එම් ඉල්ලුම්කාර සමාගම, ණයක් ආපසු ගෙවීම හෝ සිවිල් අලාභයක් පියවීමට අදාළව ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නිසි බලය ඇති අධිකරණයක් විසින් දෙන යම් නඩු තීන්දුවක් හෝ නියමයක් සපුරාලීමට අපොහොසත්ව ඇති ද?

*15. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් මූලික තැනැත්තකු ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් රක්ෂණ ව්‍යාපාරයක තැරැව්කරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, ප්‍රධාන නිලධරයකු හෝ විශේෂිත නිලධරයකු ලෙස සිටිනු ලැබ හෝ එවැනි යම් අධිකාරීමය තනතුරක් දරනු ලැබ තිබේ ද?

*16. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් මූලික පුද්ගලයකු –

(i) ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ප්‍රදානය කර ඇති බලපත්‍රය හෝ වෙනත් අධිකාරී බලය අත්හිටවනු ලැබ ඇති හෝ අවලංගු කරනු ලැබ ඇති ; හෝ

(ii) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව ගණන් බේරා වසා දමනු ලැබ ඇති හෝ ගණන් බේරා වසා දමමින් පවතින හෝ අනිවාර්යය ඇවර කිරීමක් කරනු ලැබ ඇති හෝ අද්මිනිස්ත්‍රාසිකරණයට යොමු කර ඇති,

යම් රක්ෂණ ව්‍යාපාරයක තැරැව්කරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, ප්‍රධාන නිලධරයකු හෝ විශේෂිත නිලධරයකු ලෙස සිටිනු ලැබ හෝ එවැනි වෙනත් යම් අධිකාරීමය තනතුරක් දරනු ලැබ තිබේ ද ?

17. ඉල්ලුම්කාර සමාගම සුදුසු සහ යෝග්‍ය වන්නේ ද යන්න තක්සේරු කිරීම පිණිස ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සාධාරණව දැනුවත් විය යුතු වෙනත් යම් තොරතුරු මේ ආකෘතියට අමුණන ලද වෙනම කඩදාසියක සපයන්න.

18. ඔබ විසින් අවම වශයෙන් රුපියල් මිලියන දහයක සීමාවකින් යුත් වෘත්තීය වගකීම් රක්ෂණයක් භාර දී තිබේ ද?

එසේ නොමැතිනම් මේ ආකෘතියට වෙනත් ඇමුණුමක් මගින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් සපයන්න.
(ලියාපදිංචි කළ දින සිට බලපැවැත්විය යුතු වෘත්තීය වගකීම් රක්ෂණ ගිවිසුමේ පිටපත් අමුණන්න.)

19. ඉල්ලුම්කාර සමාගම රක්ෂණකරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ හෝ තැරැව්කරුවකුගේ පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ අශ්‍රිත සමාගමක් වන්නේ ද?

20. ඉල්ලුම්කාර සමාගමේ කොටස්කරුවකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු, නිලධරයකු හෝ අධ්‍යක්ෂවරයකු, රක්ෂණකරුවකුගේ, රක්ෂණ නියෝජිතයකුගේ හෝ තැරැව්කරුවකුගේ අධ්‍යක්ෂවරයකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු, නිලධරයකු, කොටස්කරුවකු, සේවා නියුක්තිකයකු වන්නේ ද?

21. **සහතික කිරීම :**

අපගේ දැනීමට හා විශ්වාසයට අනුව ඉහත සඳහන් කරන ලද තොරතුරු සහ අමුණන ලද ලේඛන සම්පූර්ණ වූ, සත්‍ය වූ සහ නොමග නොයවන සුළු වූ බවට අපි ප්‍රකාශ කර සහතික කර සිටිමු.

අධ්‍යක්ෂවරයාගේ හෝ වෙනත් බලයලත් අත්සන්කරුවකුගේ නම : (තනතුර සඳහන් කරන්න)
අධ්‍යක්ෂවරයාගේ / බලයලත් අත්සන්කරුගේ අත්සන :
දිනය :

සමාගම් ලේකම්වරයාගේ නම :
සමාගම් ලේකම්වරයාගේ අත්සන :
දිනය :

* පිළිතුර ''ඔව්'' නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ කෙසේ වුවත්, අයදුම්කරු යෝග්‍ය සහ සුදුසු බවට කරුණු පහදන්න. (අවශ්‍ය නම් වෙනම පත්‍රිකාවක් යොදා ගන්න.)

**ආකෘති පත්‍රය පිරවීම සඳහා උපදෙස් :**

(1) මේ ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙරාතුව රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සහ 2017 ජූලි 05 වන දින 2026/27 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකරන ලද අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රීතිවල විධිවිධාන තේරුම් ගැනීම සහ අධ්‍යයනය කිරීම වැදගත් වේ.

(2) ඉල්ලුම්කරු විසින් උපකාරක ලේඛන සමග නිසිලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය භාරදිය යුතු අතර සඳහන් කළ යුතු අයිතමයන් නොමැති අවස්ථාවල දී කරුණාකර ''අදාළ නොවේ'' යන්න සඳහන් කළ යුතු ය. වෙන් වෙන් වූ තොරතුරු පත්‍රිකා අමුණා ඇති අවස්ථාවල දී ආකෘති පත්‍රය මත සටහන් කරන්න.

(3) ඉල්ලුම්කාර සමාගමේ එක් එක් අධ්‍යක්ෂවරයා විසින් අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රීතිවල 3 වන රීතියට ඒ ඉල්ලුම්කාර සමාගම අනුකූල වන බවට සනාථ කර ප්‍රකාශ කර දිවුරුම් ප්‍රකාශ භාරදිය යුතු ය.

(4) ඉල්ලුම්කාර සමාගම විසින් සේවයේ යොදවන ලද හෝ ඉල්ලුම්කාර සමාගමේ විධානය යටතේ සේවය කරන අතරතුර දී රක්ෂණ අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ යෙදී සිටින එක් එක් තැනැත්තා විසින්, එහි අංක 7 දරන අයිතමය හැර, අලාභ ගැලපුම්කරුවකු ලෙස (තනි පුද්ගලයන් වශයෙන්) ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර භාර දිය යුතු ය.

(5) රුපියල් හැත්තෑපන් දහසක ලියාපදිංචි කිරීමේ ගාස්තු මුදලක් (අදළ බදු සමග) ''ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය'' නමට ලියන ලද ආදයකයාගේ ගිණුමට පමණක් චෙක්පතක් මගින් හෝ බැංකු අණකරයක් මගින් ගෙවනු ලැබිය යුතු ය.

(6) ඉල්ලුම්පත්‍රය අමුණා ඇති ලේඛනවල පිටපත් ඒවායේ මුල් පිටපත්වල සත්‍ය පිටපත් ලෙස දිවුරුම් කොමසාරිස්වරයකු විසින් හෝ සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කළ යුතු ය.

(7) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් එහි සියලු කරුණු සම්පූර්ණ කර ඇත්නම් පමණක් ලියාපදිංචි කිරීම සඳහා සලකා බලනු ලැබේ.

(8) මේ ඉල්ලුම්පත්‍රය යටතේ නියම කරන තොරතුරු සහ ලේඛන හෝ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් නියම කරන ලද යම් තොරතුරු හෝ ලේඛන භාර දීමට අපොහොසත් වීම නිසා ඉල්ලුම්පත්‍රය පිළිබඳ කටයුතු කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය හැකි ය.

(9) ඉල්ලුම්කරු විසින් ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කිරීමට පෙරාතුව ඉල්ලා අස්කරගනු ලබන්නේ නම් ඉල්ලුම්කාර සමාගම විසින් ගෙවන ලද ගාස්තුවලින් (බදු නොමැතිව) සියයට පනහක මුදල් ප්‍රමාණයක් පමණක් ආපසු ගෙවනු ලැබේ.

(10) අසත්‍ය හෝ නොමග යවන සුළු තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ වරදක් වේ.

07 - 640

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.